# ලංකාවේ දේශගුණයට බලපාන සාධක

**දේශගුණය යන්න කෙටියෙන් පවසතොත් කාලගුණයේ සාමාන්‍ය තත්ත්වයයි කිව හැක. කාලගුණය කාලය පිළිබඳ විචල්‍යතාවකි වායුගෝලයේ කායික තත්ත්වයන් විග්‍රහ වෙයි. දේශගුණය යන්න ප්‍රදේශය පිළිබඳ විචල්‍යතාවකි. යම් ප්‍රදේශයක දිගු කාලයක් තුළ පවත්නා කාල ගුණිත සිද්ධීන්ගේ සාමාන්‍ය තත්වය දේශගුණය ලෙස සලකනු ලැබේ. දේශගුණය වටහා ගැනීමේ දී අදාළ වන වායු ගෝලීය තත්ත්වයන්ද දේශගුණික පාලක අංශවල ප්‍රතිඵලයකි. ස්වකීය සාධක වූ භූගෝල විද්‍යාත්මක කරුණුත් ගුණිත වූ කාලගුණ විද්‍යාත්මක කරුණුත් දේශගුණයට බලපායි. ලංකාවේ දේශගුණයට බලපාන කරුණු ගැන සලකා බලමු.**



## ග්‍රාහීය පිහිටීම

සාධකයක් වූ පිහිටීම අනුව දේශගුණය හැඩ ගැසී ඇති අයුරු පෙනේ. ඕනෑම රටක දේශගුණයට අක්ෂාගානුගත පිහිටීම වැදගත් වේ. දේශාංශ පිහිටීම එතරම් බලපාන්නේ නැත. උත්තරාක්ෂය අංශක භාග 5.55 - 9.50 දක්වා පිහිටි නිසා නිරක්ෂීය පිහිටීමක් ඇතැයි කිව හැකිය. වායු ගෝලීය ක්‍රියාකාරිත්වය සමග පිහිටීම අනුව පාලනය වේ. මේ ප්‍රදේශය තුළ හිරු රැස් පුළුල් අයුරින් බලපාන නිසාවන අධික සූර්ය තාපනය වැදගත් අයුරින් දේශගුණයට බලපායි. නිරක්ෂයන්ත පිහිටීම නිසා අධික උෂ්ණත්වයක් ද අධික සූර්ය තාපනයක් ද ඇති වේ. අධික උෂ්ණත්වය නිසා සංවහන ක්‍රියාකාරිත්වය පැහැදිලිව දැකිය හැකි ය.

ග්‍රාහීය පිහිටීමේ භූගෝලීය සමකයකට වඩා තාප සමකය අනුව පිහිටීම බලපා ඇත. අන්තර් නිවර්තන අභිසරණ කලාපයේ පිහිටා ඇත. අන්තර් නිවර්තන අභිසරණ කලාපීය ඍතු අනුව එහා මෙහා ගමන් කරයි. තාප සමනය සමග වෙනස් වෙයි. සාමාන්‍යයෙන් තාප සමනය උ. 5 පමණ මාධ්‍යයයි. අන්තර් නිවර්තන අභිසරණ කලාපීය සාමාන්‍යයේ උ.භා.15 හා අ.භ. 5 වෙයි. තාප සමකය වෙනස් වීමට අනුකූලව සුළං පටි ද සංක්‍රමණය වීමෙන් උතුරු හා දකුණු නිවර්තන වලදී ලංකාව ඊසාන දිග හා ගිනි කොණ දිග වෙළඳ සුළං වලට හසු වේ. අන් කාලවලදී සමක කාලගුණ තත්ත්වයි. සූර්ය ගමන අනුව සියළුම දේශගුණක පටි අවුරුද්දේ කාලයකට එහා මෙහා යයි. ඒ අනුව ලංකාව කාලයකදි වෙළඳ සුළං තීරයකට අනිත් කාලයේදී ඩොල්ඩ්‍රම් (නිවාත) තීරයට හසු වේ. ශීත ඍතුවේදී උතුරු වෙළඳ සුළං කලාපයට හසු වේ. මෙකල පිහිටීම අනුව ග්‍රාහීය සුළං වලට හසුවේ. වෙළඳ සුළං හමයි.ඒවා අපි ඊසාන දිග සුළං වශයෙන් කියමු. දළ වශයෙන් ඩොල්ඩ්‍රම් තීරය බලපවත්නා මාර්තු, අප්‍රියෙල්, ඔක්තෝබර්, නොවැම්බර් කාලවල සංවහන වැස්ස ආදි සමක නිවාත ලක්ෂණ බලපායි. නමුත් මැයි සිට සැප්තැම්බර් දක්වා වෙනත් කරුණු නිසා එය වැසී යයි.

## ඉන්දියානු උප මහාද්වීපය ආසන්නයේ පිහිටීම

මේ අනුව දිවයින විශාලම මහාද්වීපයකට ආසන්නව හා අවට සාගරයකින් ද පිහිටා ඇත. මහාද්වීප හා සාගරික වාතස්කන්ධවලට ලංකාව ලක්වනු ඇත. ඉන්දියානු උප මහාද්වීපයට ඉතා ආසන්නව ලංකාව පිහිටා ඇත. ඉන්දියානු භූමි ස්කන්ධය අනුව අඩු පීඩන වැඩි පීඩන මධ්‍යස්ථාන එහි ඇති වේ. මේ ආශ්‍රිතව ගමන් ගන්නා වායු ගමන හරහා දිවයින පිහිටා ඇති නිසා මේ දේශගුණික බලපෑම ඇති වේ. අඩු පීඩන කලාපයේ පිහිටීම අනුව ගිණිකොණ දිග වෙළඳ සුළං නිරිත දිගින් උත්තරාර් ගෝලයට ඇතුලු වේ. ශීත ඍතුවේ ඉන්දියාවේ වැඩි පීඩන මණ්ඩලවල සිට පිටට හමන සුළං ලංකාවටද බලපායි. මෝසම් ලංකාව අසල තිබෙන මහාද්වීප නිසා ඇති වන්නක් බව අපට පැහැදිලි ය. ඉන්දියානු ප්‍රදේශයට ආසන්නව පිහිටීම නිසා එහි පවත්නා මෝසම් සුළං මෙහි වාතය කළඹන සුළුය. මැයි සිට සැප්තැම්බර් දක්වා නිරිත දිග මෝසම් සමය ලංකාව සාගරික වාතස්කන්ධවලට ලක් වේ. වෙනත් ආශ්‍රිත උණුසුම් තත්ත්වයන් මාතලේ ප්‍රදේශයට බලපායි.

ලංකාව නිවර්තන වා සුළි ගමන් ගන්නා මාර්ගයේ පිහිටීම නිසා ඔක්තෝබර්, නොවැම්බර් යන මාසවල ලංකාවේ උතුරු කොටසට වා සුළි ලක්ෂණ ඇති වේ. ඔක්තෝබර් සිට ජනවාරි දක්වා සාමාන්‍යයෙන් ලංකාවේ වා සුළි ක්‍රියාකාරිත්වය සිදුවිය හැකි ය.එහෙත් මින් නොවැම්බර් මස දිවයිනේ වා සුළි ක්‍රියාකාරිත්වය වඩාත් වැදගත් බව කියැ වේ. දකුණු ඉන්දියාව කරා එන නිවර්තන වා සුළි ගමන් ගන්නා මාර්ගයේ ලංකාව පිහිටා ඇත. බෙංගාල වරායේ හටගන්නා වා සුළිවල ගමන් මාර්ගය මඩකලපුව හා මන්නාරම සම්බන්ධ කරන රේඛාව ඔස්සේ බව පිළිගැනීම ය. ආචාර්ය ජෝර්ජ් තම්බයියා පිල්ලේ මහතා දිවයිනේ කාලගුණය කෙරේ නිවර්තන අවපාතවල බලපෑම සෙවීම සඳහා 1845 සිට බල පෑ අවපාත ගැන විග්‍රහ කරන ලදී. නැගෙනහිර හා ඊසාන දිග ප්‍රදේශවල තදබල වර්ෂාවලට ද ජල ගැලීම් ,කුණාටු ආදියට වා සුළි හේතු වේ.

## නිරිත දිග මෝසම

ලංකාවේ දේශගුණය පාලනය කරන සාධකයක් වශයෙන් නිරිත දිග මෝසම් ද වැදගත් ය. නිරිත දිග ප්‍රදේශයේ අධික වැසි ඇති වීමටත් අනිත් කොටස්වල වියළි බවක් මැයි සිට සැප්තැම්බර් දක්වා ඇතිවීමටත්, හේතුව හැටියට මුලදී සලකන ලද්දේ ථාර් අඩු පීඩන කලාපය යි. එසේම දකුණේ ඇති සාගරයේ වැඩි පීඩන මණ්ඩලය යි. එහෙත් මෑතදී මෙය හදිසියේ කඩා වැටීමක් ලෙස ද සොයා ගන්නා ලදී. මෝසම් ඇතිවීමේ ප්‍රධාන කාරණයක් හැටියට ඉහළ වායුගෝලීය සිද්ධීන් ද දක්වයි. නිරිත දිග මෝසම කඩා වැදීමට උප නිවර්තන ජෙට් ධාරාව ද සම්බන්ධ වේ.

❑

**සිරිපාල මාදුවගේ**